- බෝ්පේ බටහිර 5000 දීමනාව ලබා දීම.





- 105 වැලිපිටිමොදර වසමේ ඉදිරිපත් වි ඇති අභියාචනා සඳහා රු.5000 දීමනාව ලබාදීම අද දින සිදු කරන ලදි.







- සියඹලාගහවත්ත වසමේ ඉදිරිපත් වී ඇති අභියාචනා සඳහා රු.5000 දීමනාව ලබාදීම අද දින සිදු කරන ලදි.














- ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කලුවැල්ල ග්‍රාම නිලධාරී වසමෙ ජීවනෝපාය අහිමි වූ ජනතාවට රු 5000 සමාජ ප්‍රතිලාභ මුදල ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයේදී සමුධරී නිලධාරී මහතා සමග ග්‍රාම නිලධාරී මහත්මිය ලබාදෙන අයුරු











රජය මගින් ලබාදෙනු ලබන දීමනා සම්බන්ධයෙන් ඔබට ඇති ගැටළු හා අභියාචනා ලබාගැනීම සඳහා, ඒ වෙනුවෙන්ම සැකසූ සුවිශේෂ ක්‍රමවේදයක් හෙට සිට එනම් මැයි මස 04 වෙනි දින සිට ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී ක්‍රියාත්මක වේ. ඔබගේ ඉදිරිපත් කිරීම අප විසින් ඒ සඳහා සකස් කරන ලද පෙට්ටියක් ආධාරයෙන් එකතු කරගනු ලබන අතර, මෙහිදී සේවාලාභී ඔබගේත්, කාර්යයෙහි නිරත වන නිලධාරීන්ගේත් ආරක්ෂාව වැඩිදුර තහවුරු කිරීම අපේක්ෂා කෙරේ.














තිරය පිටුපස සවිය

කොරෝනා වසංගතය හේතුවෙන් සමාජ දුරස්ථභාවය ඇතිකිරීම අරභයා රජය විසින් විවිධ ක්‍රියාමාගර් ගනිමින් සිටියදී ජනතාව අපහසුතාවයට පත්වීම වැලැක්වීම අරභයා ප්‍රාදේශීය ලේකම් තුමිය, මාන්ඩලික නිලධාරීන් ඇතුළු බහුතර කායර්ාලීය නිලධාරීන් තම රාජකාරීන් හැකිතාක් සාමාන්‍ය අයුරින් පවත්වාගැනීමට කටයුතු කරන ලදි. මෙහිදී තමන්ගේ පුද්ගලික සනීපාරක්ෂාවද සපයාගනිමින් විශිෂ්ඨ ජනතා මෙහෙවරක් ඉටුකරන ලදි.












MISSION


VISION









## යහපැවැත්මෙන් සුරැකෙමු

කොවිඩ් 19 වසංගතයේ බලපෑම නිසා අවිධිමත් වූ සාමාන්‍ය රජයේ කායර්ාල සෞඛ්‍ය අංශවල උපදෙස් පරිදි මීටරයේ පරතරය කායර්ාලය තුළ ලකුණු කරමින් සාමාන්‍ය කායර්ාල ක්‍රියාවලිය යථාවත් කිරීම සඳහා ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කායර්ාලය විසින් අවශ්‍ය කටයුතු සූදානම් කෙරිණි. ප්‍රාදේශීය ලේකම් තුමියගේ ඉල්ලීම පරිදි ගාලු නගරය තුළ ජනතාව රැස්වෙන ස්ථාන එනම්, දුම්රිය ස්ථානය, තැපැල් කායර්ාලය, බස් නැවතුම්පොළ හා පොලිසිය යන ආයතනයන්හි ද මෙම ලකුණු කිරීම් යුහුසුළුව සිදුකරන ලදී. මේ සඳහා සත්භාවයෙන් අනුග්‍රහය සැපයූ සවෙර්ාදය ආයතනයට මහජනතාව වෙනුවෙන් කෘතවේදීත්වය පිරිනමමු



සාමාන්‍ය ජන ජීවිතය පවතින තත්ත්වය යටතේ යථාවත් කිරීමේදී අත්‍යවශ්‍යම අංගයක් වන නිවැරදිව දෑත් සේදීමේ විධිමත් ස්ථානයක්, ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් තුමියගේ කාරුණික ඉල්ලීම පරිදි යුනිලීවර් ශ්‍රී ලංකා ආයතනය මගින් ලබාදීමට කටයුතු කර තිබුණි. ගාල්ල ප්‍රධාන බස් නැවතුම්පොළ පරිශ්‍රයේ ස්ථාපිත කරන ලද එය මහජනතාව සඳහා විවෘතව පවතී. එම සමාජ මෙහෙවර අගය කරමින් ඒ සඳහා ජල සැපයුම කඩිනමින් ලබාදීමට කාරුණික වූ ගාල්ල නගරාධිපති තුමන්ටද බෙහෙවින් කෘතඥ විය යුතුය.









කොවිඩ් 19 වසංගතය පැතිරීයාම නිසා මන්දනය වූ සාමාන්‍ය කාර්යාල සේවා ක්‍රමය, නවතම මුහුණුවරකින් කොට්ඨාසය තුලදී ක්‍රියාත්මක කිරීමට මෙවර කඩවත්සතර

ප්‍රාදේශීය ලේකම් කායර්ාලය සූදානමින් සිටි. සේවා අපේක්ෂකයින්ගේ සේවා අවශ්‍යතාවය දුරකථනය ඔස්සේ ලබාගෙන, අදාළ නිලධාරීන් හමුවීම සඳහා වෙලාවක් වෙන්කර ගැනීම මෙහි මූලික අධියර වේ. තවදුරටත් මෙහි දිගුවක් ලෙස අන්තජර්ාලය හරහා මෙම සේවාව (Online Appointments) ලබාදීමට බලාපොරොත්තු වේ.